ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue, Colombo 07.

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2684051
ඊමේල් / ஈ - மெயில் / E-mail: Landcom@sltne

මගේ අංකය / எனது இல / MY NO: ආර්.කෝ.23(1v)

ඔබේ අංකය / உமது இல / YOUR NO:

දිනය / திகதி / DATE: 2008.10. 22

03 NOV 2008

චක්‍රලේඛ අංක:- 2008/7

සියළුම පලාත් ඉඩම් කොමසාරිස් වරුන්.

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන අවසර පත්‍ර (ඉ.කො. 144) සඳහා භාවිතා කරන මුද්‍රිත ආකෘතිය අවලංගු කිරීම**

දිවයිනේ විවිධ ප්‍රදේශ වල ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන අවසර පත්‍ර ව්‍යාජ ලෙස නිකුත් කර ඇති බවට තොරතුරු වාර්තා වී ඇත. ඇතැම් අවසර පත්‍ර ජායා පිටපත් කල ආකෘති වල නිකුත් කිරීමද සිදුවන බව පෙනේ. එම නිසා දිවයින තුල රජයේ ඉඩම් සඳහා ව්‍යාජ බලපත්‍ර නිකුත් වීමේ අවධානමක් ඇති විය හැකි බැවින් වහාම ක්‍රියාත්මක වන පරිදි දැනට භාවිතයේ ඇති ඉ.කො. 144 දරණ ආකෘතිය අවලංගු කරන ලද බව කාරුණිකව දන්වා සිටිමි.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නව අවසර පත්‍රයක් ඉ.කො. 144 ඒ අංකයෙන් ආරක්ෂිත කඩදාසියක රහස් සංකේත භාවිතා කරමින් මුද්‍රනය කර ඇති අතර මෙම ආකෘති අඩංගු පොත් නිකුත් කිරීම විධිමත් වැඩ පිළිවෙලක් යටතේ පමණක් සිදු කිරීමටද තීරණය කර ඇත. මේ අනුව ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් වරුන්ට තම කොට්ඨාශය තුල ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදා දෙන ඉඩම් ලාභීන්ට බලපත්‍ර නිකුත් කිරීම අවශ්‍ය වන විට ඉඩම් කච්චේරියේ අවසන් තේරීම් ලැයිස්තුව හෝ 20 (අ) වගන්තිය යටතේ අනුමැතිය දුන් අවසන් නාමලේඛනය ඔබ වෙත එවා අවශ්‍ය බලපත්‍ර සංඛ්‍යාව ඉල්ලා සිටිය යුතු අතර ඔබගේ නිර්දේශය අනුව අවශ්‍ය බලපත්‍ර සංඛ්‍යාව පමණක් මුදා හැරීමට කටයුතු කරනු ලැබේ. සෑම බලපත්‍රයක්ම අංක පිළිවෙලක් යටතේ පිටපතක් සහිතව මුද්‍රණය කර ඇති අතර එම අංක පිළිවෙල මෙම කාර්යාලයේ සටහන් කරගනු ලැබේ. කරුණාකර මේ අනුව ඔබට අවශ්‍ය ඇතැවුම අදාල නාම ලේඛන සමඟ මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මේ සමඟ ඔබගේ කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල දැනට ගබඩා කර ඇති ඉ.කො.144 ආකෘති ද වහාම විනාශ කර දැමීමට උපදෙස් ලබාදෙන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස.
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-

1 ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, — දැ.ගැ.ස.

2 සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත: — ඔබට අවශ්‍ය බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ ඉල්ලීම ඉඩම් කච්චේරි අවසන් නාම ලේඛනය හෝ 20 අ අනුමැතිය දුන් නාම ලේඛනය සමඟ අදාල පලාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

3 නි.ඉ.කො./ස.ඉ.කො.(අන්තර් පලාත්) — ඔබට අවශ්‍ය බලපත්‍ර සංඛ්‍යාව ඉඩම් කච්චේරි අවසන් නාම ලේඛනය හෝ 20 අ අනුමත ලේඛනය සමඟ මා වෙත යොමුකර අවශ්‍ය බලපත්‍ර ලබා ගැනීමට කරුණාකර කටයුතු කරනන.

4 ඉ. කො. (ඉඩම්),/ඉ කො. (සං) /නි.ඉ.කො.(රන්බිම)/ ස.ඉ.කො.(නීති) — අවශ්‍ය කටයුතු සඳහා.

මගේ අංකය :

ඔබේ අංකය :

.....................................................

.....................................................

.....................................................

<u>අවසරපත්‍ර ලබා දීමට ඉ.කො 144 A ආකෘති පත්‍ර ලබා ගැනීම.</u>

ඔබේ සමාංක ..................................... හා .......................... දිනැති ලිපිය හා බැඳේ.

03. එම ලිපිය මගින් පහත නම් සඳහන් තැනැත්තන් සඳහා ඉ.සං.ආ. පනතේ 20"අ" අනුමැතිය/**ප්‍රදාන** කච්චේරි මගින් තෝරාගත් නාමලේඛනයට අනුමැතිය ලබා දී ඇත. ( එම නාමලේඛනයේ පිටපතක් ... සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි. )

03. එම තැනැත්තන් වෙත අවසරපත්‍ර ලබා දීම සඳහා ඉ.කො. 144 A ආකෘති පත්‍ර .................. ප්‍රමාණයක් ................................ ..... ....................... නිලධාරී/නිලධාරිණිය වෙත ලබා දෙන **ලෙස** කාරුණිකව ඉල්ලා සිටිමි. (මෙය පිටපත් 02 කින් ඉදිරිපත් කරමි.)

| <u>අනු අංකය</u> | <u>නම</u> | <u>ග්‍රා.නි.වසම</u> | <u>ආකෘති පත්‍ර</u> **අංකය** |
|---|---|---|---|
| | | | |

..................................

ප්‍රාදේශීය ලේකම් .

* සැ:යු :- ආකෘති පත්‍ර අංක පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් අංකනය කරනු ලැබේ.